දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை

"සෞභාග්‍යයේ දැක්ම" / "For a prosperous future"

1 වන මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට
1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota

මගේ අංකය / My No: DSH/DPS/07/DCC/වාර්තා/2025
ඔබේ අංකය / Your No:
දිනය / Date: 2025.09.03

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - *2025.08.27*</u>

*2025.08.27* වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් විශේෂ සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටුකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතනවල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථාවලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03. එසේම, 2025.09.30 දිනට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පැවැත්වීමට යෝජිත හෙයින් ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය **2025.09.25** දිනට හෝ ඊට ප්‍රථම මා වෙත *DCC Hambantota WhatsApp* වෙත හෝ *dpshambantota@gmail .com* වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04. තවද, මෙම වාර්තාව *www.hambantota.dist.gov.lk* දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබා ගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

පිටපත්:-
01. දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර එම්.කේ.බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමා - කරු.දැ.ගැ.ස.
02. හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා - කරු.දැ.ගැ.ස
03. ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
04. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස

District Secretary - 047 2256235
Additional District Secretary (Admin) - 047 2256232
Additional District Secretary (Land) - 047 2256002
Chief Accountant - 047 2256246
Director (Agriculture) - 047 3628890
Director (Planning) - 047 2256234
Assistant District Secretary - 047 2256945
Administrative Officer - 047 2256285
Office / Fax - 047 2256235, 047 2256247
email : moha.dist.hambantota@gmail.com
Web site : www.hambantota.dist.gov.lk

# <u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම</u>
## <u>2025.08.27</u>

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමාගේ සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා දේශපාලන නායකයින්ගේ මෙන්ම රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025.08.27 වන දින පෙ.ව. 9.00ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ සියලුම දේශපාලන නායකයින් මෙන්ම පලාත් පාලන ආයතනවල ගරු නගරාධිපති හා සභාපතිවරුන් හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් තුමා විසින් පිළිගැනීමෙන් අනතුරුව ගරු සම සභාපතිතුමන්ලා වෙත රැස්වීමේ ඉදිරිකටයුතු කරගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලදී.

ගරු සභාපති තුමා විසින් පැමිණ සිටි සියළුම දෙනා පිලි ගැනීමෙන් පසු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට අඛණ්ඩ පැමිණීම අපේක්ෂා කරන බවත් නොවැලැක්විය හැකි හේතුවක් මත පැමිණීමට නොහැකි වේනම්, වගකිවයුතු නිලධාරියෙකු ඒ සඳහා සහභාගි කරවීමට කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදි. අනතුරුව, පසුගිය වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීමෙන් පසු රැස්වීම් වාර්තාව සහා සම්මත කර න්‍යායපත්‍රයට අනුව සභාවේ කටයුතු සිදු කරන ලදි. එහිදී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ. .

| අ.අ. | කාරණය | සාකච්ජා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01. | 2025.07.30 දිනැති සම්බන්ධීකරණ රැස්වීමේ ප්‍රගතිය සාකච්ජා කිරීම. | | | |
| 1.1 | නවයාලවිල ජලාශය සංවර්ධනය කිරීමේ කෙටි කාලීන පියවර | මෙම ජලාශය සංවර්ධනය කිරීමේ සබ්‍යතාවය අධ්‍යයනය කර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වෙත යොමු කර ඇති අතර එහි නිර්දේශ ඉල්ලා සාමාන්‍යාධිකාරී වෙත යොමු කර ඇති බවට කරුණු ඉදිරිපත් විය. | කඩිනමින් එම නිර්දේශ සහිත වාර්තාව ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රාදේශීය කළමණාකරු ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 1.2 | උද්ධකන්දර ග්‍රාම නිලධාරී වසමේ කුනුවල අසල අනීතික ලෙස බොරළු කපා ප්‍රවාහනය කිරීම. | අදාල බලපත්‍රය මේවන විට අවලංගු කර ඇති බව සහ එම බලපත්‍රය ලබාදීමේදී සලකා බලන ලද නිර්ණායක හා කොන්දේසි මොනවාද යන්න හා රාජ්‍ය භාගය අය කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉල්ලා 2025.08.12 වන දින අම්බලන්තොට භූ විද්‍යා හා පතල් කාර්යාංශය වෙත ලිපියක් යොමු කර ඇත.<br>එසේම, 2025.08.02 දින වන සංරක්ෂන දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ ක්ෂේත්‍ර පරික්ෂණයක් සිදුකර ඇති අතර බලපත්‍රය අත්හිටුවා තිබුනද මෑතකාලයේදී කැණීම් සිදුකර ඇති බවටත් එසේම නිකුත් කරන ලද බලපත්‍රයට අදාලව කැණීම් කරන ලද කියුබ ප්‍රමාණය පිලිබඳව මූලික පරීක්ෂණ සිදුකරන බවත් එසේ කැණීම් කර ගන්නා ලද පස් රජේ ආයතන මඟින් සිදුකරන සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාගෙන ඇති බවත් ඒ සම්බන්ධවද පරීක්ෂණ සිදුකරන බවට කරුණු ඉදිරිපත් විය. | සමස්ථය සම්බන්ධව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදි. | ප්‍රාදේශීය ලේකම්, තිස්සමහාරාම.<br><br>කැණීම් ඉංජිනේරු, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය.<br><br>දිසා වන නිලධාරී, හම්බන්තොට |
| 1.3 | සංවර්ධන ව්‍යාපෘති සඳහා පස් ලබා ගැනීම. | තිස්සමහරාම - පස් ලබාගැනීමට අක්කර 2 ක භූමි ප්‍රමාණයක් උද්ධකන්දර ප්‍රදේශයෙන් හඳුනාගෙන ඇති අතර එය වෙන් කරගැනීම සඳහා මැනුම් කර ගැනීමට මිනින්දෝරු කාර්යාලය වෙත යොමු කර ඇති බවත් මිනින්දෝරු අධිකාරි මඟින් | අද දිනම පිඹුර ලබා දීමට හැකි දිනය දැනුම් දෙන ලෙසත් ඒ සඳහා කඩිනම් පියවර ගන්නා ලෙසත් උපදෙස් දෙන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්),<br>ප්‍රාදේශීය ලේකම් - තිස්සමහරාම<br>කැනීම් ඉංජිනේරු, භූ විද්‍යා හා පතල් |

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | පිළිතුර ලබාගතයුතු බවටත් වැඩිදුරට සාකච්ඡා විය . | | කාර්යාංශය<br>ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී, හම්බන්තොට |
| 1.4 | බැහැරකරන ලද ප්ලාස්ටික් එකතුකර කැබලිවලට වෙන්කිරීමේ නිෂ්පාදන කර්මාන්තය සඳහා බිම් කොටස් වෙන් කිරීම. | මෙකී කර්මාන්තය සිදුකරන තිදෙනා සඳහා එක් අයෙකුට පර්චස් 100 බැගින් පර්චස් 300 ක් බවඅත කර්මාන්තපුරයේ ආරම්භ කිරීමට අවශ්‍ය ඉදිරිකටයුතු සඳහා දකුණු පළාත් ප්‍රාදේශිය කර්මාන්ත අධ්‍යක්ෂ වෙත දැනුම් දී ඇති බවත් ඒ අනුව, මෙකී නිෂ්පාදන ආයතන හා අදාල ක්ෂේත්‍ර පරික්ෂණය සඳහා 2025.09.05 වන දිනෙන් පසුව දිනක සිදුකිරීමට යොදාගන්නා බව දැනුම් දී ඇති බවටද කරුණු ඉදිරිපත් කරන ලදි. | මේ අනුව ඉදිරි කටයුතු අමාත්‍යාංශය සම්බන්ධීකරණය කරගනිමින් අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකරන ලෙස දැනුම් දෙන ලදි. | ප්‍රාදේශිය ලේකම්, අම්බලන්තොට |
| 1.5 | හම්බන්තොට මහරෝහල - වකුගඩු රෝග ප්‍රතිකර්ම ඒකකයේ ඉදිකිරීම් නැවත ආරම්භ කිරීම. | 2025.08.25 වන දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ මුලිකත්වයෙන් අදාල සියළු පාර්ශව එක්ව මේ සම්බන්ධව ඉදිරි කටයුතු සැලසුම් කිරීම සඳහා සාකච්ඡාවක් පැවැත්වූ බවත් එහිදී, සති 2 ක් ඇතුලත ඇස්තමේන්තු සකස්කර ඉදිරිපත් කිරීමට තීරණය කර ඇති බවත් හැකි ඉක්මනින් අදාල කටයුතු කඩිනම්කර මෙම වසර අවසානයට පෙර වකුගඩු රෝගීන් සඳහා වන රුධිර කාන්දුකරණ ඒකකයෙහි වැඩ නිමකිරීමට කටයුතු කරන බවටත් කරුණු ඉදිරිපත් විය. | අමාත්‍යාංශ ලේකම් ඇතුළු නිලධාරීන් දේශපාලන නායකත්වයද සමඟ පාර්ලිමේන්තු කමිටු කාර්යාලයේදී රැස්වී මේ සම්බන්ධව තීරණ ගන්නා ලෙසත් වසර අවසානයේදී මෙහි වැඩකටයුතු අවසන් කරන ලෙසත් ලෙසත් උපදෙස් දෙන ලදි. | රෝහල් අධ්‍යක්ෂ, මහරෝහල, හම්බන්තොට |
| 1.6 | කිරින්ද වරායේ ගොඩගැසී ඇති වැලි ඉවත් කිරීම සඳහා රු.මි. 26 ක් වෙන් කිරීම. | වැලි ඉවත් කිරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු 2025.08.27 ප.ව. 2.00 ට එනම් අද දින සිදුකිරීමට නියමිත බව දැනුම් දෙන ලදි. | කඩිනමින් අදාල කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | වරාය කළමනාකරු, කිරින්ද ධීවර වරාය |
| 1.7 | 2022 වර්ෂයේ නිවාස ආධාර වැඩසටහන යටතේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙවන අදියර සඳහා මුදල් ලබා නොදීම. | බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 64 ක් බවත් ඉන් ලක්ෂ 02 බැගින් ලබාදී ඇති ප්‍රතිලාභීන් ගණන 32 ක් බවත් ලක්ෂ 01 බැගින් ප්‍රතිලාභීන් 32 කට ලබා දී ඇති බවත් මෙකී නිවෙස් වල<br>අත්තිවාරම් දක්වා නිමකල නිවාස - 16<br>ලින්ටල් දක්වා නිමකල නිවාස - 14<br>කේබල් දක්වා නිමකල නිවාස - 30<br>වහල දක්වා නිමකල නිවාස - 02<br>වැඩ ආරම්භකර ඇති නිවාස - 02<br>මෙම ප්‍රතිලාභීන් සඳහා සම්පූර්ණ ගෙවීම් නොකරන ලද හෙයින් අවිච්ඡේද මුදල් පදනම මත ප්‍රධාන කාර්යාලයෙන් අදාල ඉතිරි මුදල් ප්‍රමාණය ඉල්ලුම් කර ඇති බව හා මෙම ප්‍රතිලාභීන් අතර ආධාර ලබාදීමට සුදුසු හා නුසුදුසු යන දෙපාර්ශවයම සිටින බවට වැඩිදුරටත් කරුණු ඉදිරිපත් විය. | බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුළු ප්‍රතිලාභීන් සම්බන්ධව හා මේ වන විට දිස්ත්‍රික්කය තුළ මෙම වැඩසටහන යටතේ සිටින සියළු ප්‍රතිලාභීන් සම්බන්ධව පවතින තත්ත්වය පිළිබඳව පැහැදිලි වාර්තාවක් ලබා දෙන ලෙස දැනුම් දෙන ලදි. | ප්‍රාදේශිය ලේකම්, බෙලිඅත්ත<br><br>දිස්ත්‍රික් කළමණාකරු, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |

නිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| 1.8 | පරිපාලන සංකීර්ණය ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ විදුලි පහන් සවි කිරීම සම්බන්ධව | මහනගරසභාවට ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන බැවින් මෙම විදුලි පද්ධතිය නඩත්තු කිරීමේ වගකීමක් මහනගර සභාවට භාරගත නොහැකි බවත් ඒ සඳහා මැදිහත්වීමක් අවශ්‍ය බවටත් කරුණු ඉදිරිපත් විය. නමුත් මේ සඳහා ලබා දීමට පළාත් සභාව සතුව මුදල් නොමැති බවත් වරාය මඟින් අයවිය යුතු ගාස්තු අයකරගෙන බිල් පියවා ගැනීම සුදුසු බවටත් යෝජනා විය.<br>මේ වනවිට වරාය අධිකාරිය මඟින් ගෙවිය යුතු වරිපනම් වාරික දෙකකට යටත්ව ගෙවීම් කරන ලෙස දැනුවත් කර ඇති බවත් එකී මුදල් මඟින් විදුලි බිල ගෙවීමට පවතින හැකියාව පිලිබඳ සාකච්ඡා විය. | විදුලි බිල ගෙවීම සඳහා වරාය අධිකාරියෙන් ලැබිය යුතු වරිපනම් මුදල් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් දෙන ලදී. | පළාත් පාලන කොමසාරිස්<br>ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය<br>නාගරික කොමසාරිස් හම්බන්තොට ම.න.ස |
| 02. | අනතුරුව 2025.08.27 දිනට අදාල න්‍යාය පත්‍රයේ කරුණු සාකච්ඡා කරන ලදී. ඒවා පහත පරිදි වේ. | | | |
| 2.1 | සංවර්ධන වැඩසටහන් සම්බන්ධ දැනුවත් කිරීම. | | | |
| 2.1.1 | විමධ්‍යගත අයවැය වැඩසටහන | දිස්ත්‍රික්කය වෙනුවෙන් වෙන්කර ඇති රු.මි. 80ට අදාල ව්‍යාපෘති 49 න් මේ වන විට 10 ක් අවසන් කර ඉතිරි ව්‍යාපෘති ගැටළුවකින් තොරව ක්‍රියාත්මක වන බවට පැවසීය. | මෙම වැඩසටහන් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති වක්‍රලේඛ අනුව කඩිනමින් අවසන් කරන ලෙස උපදෙස් දෙන ලදී.<br>සංශෝධනද ඇතුළුව හඳුනාගත් යෝජනා සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර ප්‍රතිපාදන ලැබෙන තෙක් ඇස්තමේන්තු සකස්කර ගන්නා ලෙසත් කාපට් ඇතිරීම සඳහා යෝජිත මාර්ග ඒ සඳහා ප්‍රවීනතාවක් ඇති මාර්ග සංවර්ධන අධිකාරිය හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාත්මක කලයුතු බවටත් උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 2.1.2 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | රු.මි. 79.2 කට අදාල ව්‍යාපෘති 25 ක් ගැටළුවකින් තොරව අවසන් කල හැකි බවට කරුණු ඉදිරිපත් විය.<br>2025.03.12 වන දින ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මාර්ග සම්බන්ධ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ලබාදුන් උපදෙස් පරිදි රු.මි. 250 ක් මෙම දිස්ත්‍රික්කය වෙනුවෙන් වෙන් කර ඇති බවත් ඒ සඳහා සියළුම පාර්ශවයන්ගේ එකඟතාවය මත හඳුනාගෙන ප්‍රමුඛතාගත කරන ලද මාර්ග ලයිස්තුවද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන බව පැවසීය. එමෙන්ම මෙම රු.මි. 250 ක ප්‍රතිපාදන ද දිස්ත්‍රික් ලේකම් වෙත ලැබෙන බැවින් කාපට් ඇතිරීම සඳහා වැඩි යෝජනා ප්‍රමාණයක් ලැබී ඇති බවද දන්වන ලදී. එම ව්‍යාපෘති මාර්ග සංවර්ධන අධිකාරිය හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක වීම සුදුසු බවටත් යෝජනා විය. | | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br>ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය<br>දිස්ත්‍රික් ඉංජිනේරු, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.1.3 | නිලසෙවන කාර්යාල වල පහසුකම් හා අළුත්වැඩියා කිරීම - 2025 | 2023 වර්ෂයේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් හඳුනාගනු ලැබූ ව්‍යාපෘති 107 ක් ක්‍රියාත්මක බවත් ඉන් 17 ක් දැනටමත් අවසන් කර ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතින බවට කරුණු ඉදිරිපත් විය. | ලබා දෙන ලද උපදෙස් පරිදි අනුව කඩිනමින් අවසන් කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>අදාල ප්‍රාදේශිය ලේකම්වරුන් |
| 2.1.4 | දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අනෙකුත් සංවර්ධන යෝජනා - 2025 | ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ හා ප්‍රජාසවිබලගැන්වීමේ අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වන ජීවනෝපාය ව්‍යාපෘති 44 ක් අමාත්‍යාංශයට යොමුකර ඇති බවටත් ඉන් අනුමතවූ එක් ව්‍යාපෘතියක් වීරකැටිය කොට්ඨාසයේ ක්‍රියාත්මක බවත් දන්වන ලදි. | චක්‍රලේඛ අනුව කඩිනමින් අවසන් කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් |
| 2.1.5 | දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩසටහන | මුදල් ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ මෙම සංවර්ධන වැඩසටහන සඳහා දිස්ත්‍රික්කයට රු.මි.83 ක් වෙන් කර ඇති බවත් ඉන් තංගල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහා රුපියල් මිලියන 06 ක් සහ අනෙකුත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහා රුපියල් මිලියන 07 බැගින් වෙන් කිරීම සුදුසු බවටත් වූ යෝජනාවට අනුව චක්‍රලේඛයේ පරිදි හඳුනාගෙන ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු මඟින් නිර්දේශ කර අනුමත කර තිබෙන ව්‍යාපෘති 49 ක් දිස්ත්‍රක් සම්බන්ධීකරණ කමිටු අනුමැතියට ඉදිරිපත්කරන බවත් පැවසිය.<br>තවද, මෙම ව්‍යාපෘති මෙම වසරේ දෙසැම්බර් 15 වන විට අවසන්කලයුතු බවත් පැවසිය. | මෙම ව්‍යාපෘති සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ අනුමැතිය ලබාදුන් අතර ඉක්මනින්ම වැඩ අවසන් කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්<br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට / තංගල්ල/ වලස්මුල්ල |
| 2.1.6 | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන | දිස්ත්‍රික්කයේ පාසල්වල මෙන්ම යෞවන සමාජවල ක්‍රීඩා පහසුකම් සැපයීමේ අරමුණින් ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනයට හා හඳුනාගත් පාසල් සඳහා ක්‍රීඩා උපකරණ ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය සූදානම් වන බවත් ඒ සඳහා චක්‍රෙල්ඛයක් නිකුත් කර ඇති බවත් දන්වන ලදි. එකී චක්‍රලේඛය සම්බන්ධීකරණ කමිටු ගරු සභාපතිතුමන්ලා, ප්‍රාදේශිය ලේකම්වරුන් සහ නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන් (ක්‍රමසම්පාදන) වෙත WhatsApp මඟින් මේ වන විටත් යොමු කර ඇති බවත් එම චක්‍රෙල්ඛ උපදෙස් පරිදි ව්‍යාපෘති යෝජනා හඳුනාගෙන අනුමැතිය සඳහා කඩිනමින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දෙන ලෙසත් පවසන ලදි. | කඩිනම් අවශ්‍යතාවයක් ලෙස සලකා කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>අදාල ප්‍රාදේශිය ලේකම්වරුන් |

විමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.1.7 | පළමු අදියර යටතේ අත්‍යාවශ්‍ය පාලම් ප්‍රතිසංස්කරණය සඳහා රු.මි 200ක් වෙන් කිරීම. | ප්‍රමුඛතාවය මත හඳුනාගත් ප්‍රධාන පාලම් 05 අතුරින් මේ වසර අවසානයට පෙර පල්ලෙකන්ද පාලම හා මිලල්ආර පාලම් දෙකේ වැඩ කොටස් ආරම්භ කිරීමට කටයුතු කරන බවත් ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු සූදානම් කරන බවත් දැනුම් දෙන ලදී. | අදාල කටයුතු කඩිනම් කරන ලෙස පවසන ලදී. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය. |
| 2.1.8 | 2025.08.20 දිනට අනෙකුත් ආයතනවල සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසීම. | එක් එක් ආයතන මඟින් ඉදිරිපත් කරන ලද ප්‍රගතිය ඇමුණුම් අංක 01 යටතේ ඉදිරිපත් කර ඇත. | | |
| 03. | පළාත් සභා සංවර්ධන වැඩසටහන් සම්බන්ධව දැනුවත් කිරීම. | 2025.08.26 වන දින පළාත් සභාවට අයත් සියළු ව්‍යාපෘති සම්බන්ධව සාකච්ඡා කල බැවින් මෙහිදී ප්‍රගතිය විමසීමක් සිදු නොකරන ලද අතර දැනුම් දෙන ලද ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කර ඇත. | | ප්‍රධාන ලේකම්, දකුණු පළාත<br>අමාත්‍යාංශ ලේකම්වරුන්, දකුණු පළාත් සභාව<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් හා මෙහෙයුම් (දකුණු පළාත)<br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |

| අමාත්‍යාංශය | වෙන් කළ මුදල රු.මි. | ව්‍යාපෘති ගණන | වැඩ අවසන් සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|---|---|
| ප්‍රධාන අමාත්‍යාංශය | 573.89 | 231 | 20 | 25.58 |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 450.45 | 84 | 17 | 28.84 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 386.33 | 141 | 23 | 49.52 |
| ක්‍රීඩා අමාත්‍යාංශය | 128.33 | 66 | 6 | 14.57 |
| ධීවර අමාත්‍යාංශය | 272.66 | 94 | 1 | 39.20 |

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | එසේම, 2026 වර්ෂයට අදාල සංවර්ධන වැඩසටහන් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම මේ වන විට සිදුකරමින් පවතින බවත් ජනවාරි 01 වන දින වැඩ ආරම්භ කිරීම සඳහා සැලසුම් කර ඇති හෙයින් ඒ සඳහා පළාත් පාලන ආයතන හා අනෙක් සියළු ආයතන සැප්තැම්බර් 20 වන දිනට පෙර ව්‍යාපෘති යෝජනා ලබා දෙන ලෙසත් එකී යෝජනා සැප්තැම්බර් 30 දිනට පෙර පලාත් සැලසුම් ලේකම් කාර්යාලයට බාරදීමට නියමිත බව වැඩිදුරටත් පැහැදිලි කරන ලදී. | සෑම ක්ෂේත්‍රයක්ම මුල්කරගනිමින් අවශ්‍යතා ධූරාවලිය අනුව ඵලදායී ව්‍යාපෘති හඳුනා හඳුනාගෙන අදාල දිනයන්ට අනුගත වෙමින් ඒ අනුව ව්‍යාපෘති යෝජනා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු නිර්දේශ සහිතව ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදී. | |
| 04. | දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය තත්වය පිළිබඳ දැනුවත් කිරීම. | ප්‍රදේශයේ ජල සැපයුම් ගැටළු අවම කර ගැනීම සඳහා දිස්ත්‍රික් ජලසම්පාදන කමිටුවක් මඟින් සැලසුම්ගතව කටයුතු කිරීම තුළ පවතින ජල ගැටළු අවම කරගතහැකි බව යෝජනා විය. | මේ සඳහා අදාල අංශ සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය කළමනාකරු, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| | | එසේම, දිස්ත්‍රික්කයේ රෝහල්වල පවතින ඖෂධ හිඟය අවම කිරීමට කෙටිකාලීන විසඳුමක් ලෙස ඖෂධ කළමනාකරණය මඟින් කටයුතු කලයුතු බවත් පිටතින් ලබාගතයුතු ඖෂධ මොනවාද යන්න හඳුනාගතයුතු බවත් සාකච්ඡා විය. | මාසිකව රෝහල් වශයෙන් වෙන් වෙන්ව ඖෂධ වර්ග අනුව ප්‍රමාණයන් පිළිබඳව මාසිකව වාර්තාවක් ලබා දෙන ලෙස පවසන ලදී. | |
| | | තවද, 2025.07.30 දින මෙම කමිටුවේදී දැනුම් දෙන ලද රෝහල් සඳහා ආරක්ෂක මුර සේවාවක් අවශ්‍ය බවට කරුණු ඉදිරිපත් වූ අතර | මේ සඳහා සුදුසු වැඩපිළිවෙලක් කඩිනමින් සැකසීමට කටයුතු කලයුතු බවට | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |

විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | ඒ සඳහා මේ වන විට ජංගම මුරසේවාවක් ලබාදිය හැකි බවත් ස්ථිර පොලිස් මුර සේවාවක් ලබාදීමට හැකියාවක් නොමැති බවත් ඒ සඳහා සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරීන් යෙදවීමේ හැකියාව පිළිබඳව වැඩිදුරටත් සාකච්ඡා විය. | උපදෙස් දෙන ලදි. | |
| | | එසේම, ආයුර්වේද වෛද්‍ය සේවාව යටතේ සූරියවැව කොට්ඨාසය තුළ පෙරපාසල් 45 ක හා පෙරපාසල් ගුරුවරුන් 77 ක් සඳහා යෝගා අභ්‍යාස වැඩමුලුව ජූලි 11, 17, 24 හා 31 දින පවත්වන ලද බවත් පෙරපාසල් දරුවන් සඳහා ශ්වසන යෝගා අභ්‍යාස පුහුණු කටයුතු සිදුකරන බවත් පැහැදිලි කරන ලදි.<br><br>තවද, පලාත් පාලන ආයතන සතු ඉඩම් තුළ ආයුර්වේද ඖෂධ වගා කිරීමට කටයුතු කිරීම සඳහා විවෘතව ආරාධනා කරන ලදි. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අදාල ආයුර්වේද රෝහල් මූල්කරගනිමින් මෙකී වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>දකුණු පළාත් ආයුර්වේද කොමසාරිස්<br><br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් |
| 05. | දිස්ත්‍රික්කය තුළ පවතින ආරක්ෂක තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම. | සියළු ආරක්ෂක කටයුතු ක්‍රියාවට නැංවීම අතරතුර කෙතරම් උත්සාහ කලත් මත්ද්‍රව්‍ය උවදුර ක්‍රමයෙන් ඉහලයාමේ ප්‍රවනතාවයක් පවතින බවත් ළමා අපචාර කිහිපයක් වාර්තාවූ ඒ සඳහා නෛතික ක්‍රියාමාර්ග ගත් බවත් මෙම තත්ත්වය මැඩපැවැත්වීමට දැඩි ක්‍රියාමාර්ග ගතයුතු බවට සාකච්ඡා විය.<br>තවද, දකුණු පළාත තුළ පාතාල ක්‍රියාකාරකම් නිරන්තරයෙන් සිදුවන බව හා එවැනි ක්‍රියාවන්ට හිස එසවීමට ඉඩනොදිය යුතු බවටත් තවමත් අත්අඩංගුවට නොගත් මේ හා සම්බන්ධ පිරිස් නිදැල්ලේ සිටින බවටත් කරුණු ඉදිරිපත් විය. | මේ සඳහා අධීක්ෂණයකින් යුතු සක්‍රිය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දෙන ලදි.<br>ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ සේවය කර කුමන හේතුවක් නිසා හෝ මේ වන විට සිවිල් සමාජයේ ජීවත් වන සියළු පිරිස් සම්බන්ධව පැහැදිලි වාර්තාවක් ලබා දෙන ලෙසත් වාර්ෂිකව බලපත්‍ර අලුත් නොකරන ලද අවි සම්බන්ධව සොයාබලා අත්අඩංගුවට ගන්නා ලෙස දැනුම් දෙන ලදි. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |
| | | මහවැලි සංවර්ධන බලප්‍රදේශයට අයත් ඉඩම්වල අනවසර පදිංචිවීම් හා අනවසර ඉදිකිරීම් සම්බන්ධව නිරන්තරයෙන් ගැටළු පොලිසියට වාර්තා කිරීම් සිදුවන බවත් මේ සඳහා සාධනීය විසඳුමක් ලබාගතයුතු බවට යෝජනා විය. | මෙකී ප්‍රදේශයට අදාල සංවර්ධනය කරන ලද හා නොකරන ලද ඉඩම් සම්බන්ධව පැහැදිලි විධිමත් සමීක්ෂණයක් සිදුකර මෙවැනි ගැටළු ඉදිරියට වාර්තා නොවීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකසන ලෙස උපදෙස් දෙන ලදි. | නේවාසික ව්‍යාපාරය කළමනාකරු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 06. | වරායට නැව් මඟින් පැමිණෙන සංචාරකයින් සඳහා පහසුකම් සැපයීම | වරායට පැමිණෙන සංචාරකයින් රැගෙනයාම සඳහා අදාල පිවිසුම් දොරටුව ඉදිරිපිට වාහන නැවැත්වීමට සහ සංචාරකයින්ගේ පහසුවට අවශ්‍යව පවතින පහසුකම් නොමැති හෙයින් දිනෙන් දින ගැටළුකාරී තත්ත්වයක් පවතින බවත් පවතින ගැටළු හා ඒ සඳහා ගතහැකි | රුහුණු සංචාරකකාර්යාංශයේ සෘජු මැදිහත්වීම මේ සඳහා ලබා දෙන ලෙසත් සියළුම පාර්ශව එක්රැස් කර ස්ථිර විසඳුමක් ලබා දෙන ලෙසත් අදාල භූමි | ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, දකුණු පළාත<br><br>සභාපති, රුහුණු සංචාරක කාර්යාංශය |

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ක්‍රියාමාර්ග සම්බන්ධව මීට පෙර සාකච්ඡා වුවත් එහි ප්‍රගතියක් නොමැති බවටත් කරුණු ඉදිරිපත් විය. එසේම, මේ සඳහා පිවිසුම් දොරටුව ඉදිරිපිට මාර්ග සංවර්ධන අධිකාරිය සතු ඉඩම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | කොටස අවශ්‍ය පහසුකම් සැපයීමට භාවිතයට ගන්නා ස්වභාවය ආදී කරුණු ඇතුලත්ව මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ඉල්ලීමක් කිරීමට උපදෙස් දෙන ලදී. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>ප්‍රාදේශීය ලේකම්, හම්බන්තොට<br><br>කළමනාකරු, හම්බන්තොට වරාය |
| **07.** | දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය මඟින් සිදුකරන ලද සියළු ව්‍යාපෘති සම්බන්ධව දැනුවත් කිරීම. | "දේශගුණ විචල්‍යතාවයන් (නියඟය සහ ගංවතුර) හේතුවෙන් ආපදාවයට ලක්වන වඩාත් සංවේදී කලාපයන්හි ගොවි ජනතාවගේ කෘෂිකාර්මික ඵලදායීතාවය ඉහල නැංවීම" අරමුණ වී ඇති අතර<br>ව්‍යාපෘති කාල සීමාව: පළමු අධියර - 2019.ජුනි සිට 2024. ජුනි - වසර 05 දෙවන අධියර - 2024 ජුලි සිට 2025 දෙසැම්බර් - වසර 1 1/2<br>සමස්ථ ආයෝජනය: ඇ.ඩො.මි.125<br>ලෝක බැංකුව ඇ.ඩො.මි. 110<br>ශ්‍රී ලංකා රජය ඇ.ඩො.මි.10<br>ප්‍රතිලාභී දායකත්වය ඇ.ඩො.මි.05<br><br>**ව්‍යාපෘති ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස,**<br>• දේශගුණික සුහුරු කෘෂි තාක්ෂණයන් සහ ක්‍රමවේදයන් ප්‍රචලිත කිරීම හා අවශ්‍ය කෘෂි උපකරණ ලබා දීම.<br>• කෘෂි නිෂ්පාදන වල අගය වැඩි කිරීම, වෙළඳපොල හඳුන්වා දීම සහ කෘෂිකාර්මික යටිතල පහසුකම් සංවර්ධනය<br>• ප්‍රතිලාභීන් සංවිධාන ගත කිරීම සහ හැකියා සංවර්ධනය.<br>• කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සුරක්ෂිතතාවය තහවුරු කිරීම.<br>• සුළු වාරිමාර්ග වැව්, අමුණු හා කෙත් ඇල මාර්ග පුනරුත්ථාපනය<br>• කෘෂි ළිං පුනරුත්ථාපනය<br>• උස්සාන වාරි ව්‍යාපෘති<br>• එල්ලංගා පද්ධති කළමනාකරණය<br><br>**ව්‍යාපෘති බල ප්‍රදේශයේ ග්‍රාම නිළධාරී කොට්ඨාශ**<br>1. ලූණුගම්වෙහෙර - 14<br>2. තිස්සමහාරාමය - 07<br>3. හම්බන්තොට - 01<br><br>**ව්‍යාපෘතිය ක්‍රියාත්මක හා මෙහෙයුම් සිදුකරන ලද ආයතන ලෙස**<br>ජාතික, පළාත්, ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් සම්බන්ධී ඇති බවත්<br>**ව්‍යාපෘති සංරචක ලෙස,**<br>• දේශගුණ සුහුරු කෘෂිකර්ම නිෂ්පාදනය<br>• කෘෂි අලෙවිකරණය ප්‍රවර්ධනය<br>• කෘෂිකර්මය සඳහා ජලය<br>• ව්‍යාපෘති කලමනාකරණය<br>**ව්‍යාපෘති ඇගයීම හා විගණනය:**<br>• මාසිකව කෘෂිකර්ම අමාත්‍යංශ ලේකම් ප්‍රධානත්වයෙන් ප්‍රගති සමාලෝචනය<br>• කාර්තුවක් අවසානයේ ලෝක බැංකු නියෝජිත ප්‍රගති සමාලෝචනය<br>• පළාත් මෙහෙයුම් කමිටුව මගින් ප්‍රගති සමාලෝචනය<br>• තුන්වන පාර්ශව සම්බන්ධ කර සිදුකරන ව්‍යාපෘති ඇගයීම් කටයුතු<br>එසේම, විගණන කටයුතු | ලෝක බැංකු ණය ආධාර වැඩසටහන යටතේ මෙකී ව්‍යාපෘතිය මඟින් සිදුකරන ලද ව්‍යාපෘති කටයුතු සම්බන්ධව ගැටළු පවතින බවට පැහැදිලි කිරීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතිය තුළ ප්‍රතිලාභීන් හඳුනාගත් පදනම ව්‍යාපෘති කාලය අවසන්වීමෙන් අනතුරුව ඉතිරිවන කටයුතු හා නඩත්තු කටයුතු සඳහා ගන්නා ක්‍රියාමාර්ග ආදී සියළු කරුණු ඇතුලත් සවිස්තර වාර්තාවක් ලබා දෙන ලෙස දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය |

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | • ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණන අංශය<br>• කෘෂිකර්ම අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය<br>• දකුණු පළාත් අභ්‍යන්තර විගණන අංශය<br>• විගණන දෙපාර්තමේන්තුව<br>මගින් සිදුවන බවට පැහැදිලි කරන ලදී. | | |
| 08. | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මගින් ඉදිරිපත් වී ඇති යෝජනා | | | |
| 8.1 | ප්‍රාදේශීය ලේකම්, කංගල්ල | | | |
| | කංගල්ල නගරසභා සීමාවට අයත් වෙරළ ආසන්නව සංචාරකයින් සඳහා පවත්වාගෙන යන අවන්හල් ඉවත් කිරීමට තීරණය කිරීම | "පොහොසත් රටක් ලස්සන වෙරළ තීරයක්" යන සංකල්පය මත අදාල ආයතන ඊට සුදුසු පරිදි කටයුතු කරන බවත් ඒ අනුව මතුවූ ගැටලුවක් බවට කරුණු ඉදිරිපත් විය. | පවතින නීතිමය තත්ත්වයන් මත ඊට අදාලව කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 09. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත්වී ඇති යෝජනා | | | |
| 9.1 | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් ඉදිරිපත්වූ ව්‍යාපෘති යෝජනා | 2025 වර්ෂයේ "එකමිටට ගොවි බිමට" සුළුවාරි මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති යෝජනා 16 ක් ඉදිරිපත් කරමින් එකී ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | මෙකී ව්‍යාපෘති සඳහා අදාල අනුමැතිය ලබා දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |
| 9.2 | වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය මගින් ඉදිරිපත්වූ ව්‍යාපෘති යෝජනා | IWWRMP හා IRDCRP ව්‍යාපෘති යටතේ හම්බන්තොට කලාපයේ තිස්සමහරාම ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසයට අයත් ධූණුගම්වෙහෙර ව්‍යාපාරයේ සිදුකිරීමට නියමිත කර්මාන්ත සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | මෙම කර්මාන්ත සඳහා අදාල අනුමැතිය ලබා දෙන ලද අතර සියළු කර්මාන්ත සම්බන්ධව පැහැදිලිව තොරතුරු ඇතුලත් කරන ලද පොතක් සකස්කර ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br>වාරිමාර්ග අධ්‍යක්ෂ, හම්බන්තොට |
| 9.3 | තිස්සමහරාම ප්‍රාදේශීය සභාව මගින් ඉදිරිපත්වූ ව්‍යාපෘති යෝජනාව | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සහ 2025.07.22 දින පැවති ප්‍රාදේශීය සභා මහාසභා අනුමැතිය ලත්, "කිරින්ද රෝහල ඉදිරිපස අන්දරගස්යාය පාර සිට අතුරු මාර්ගය (දිග - 500m, පළල - 4m) නඩත්තු පහසුව සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පැවරීම" සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | මෙම ඉල්ලීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශ ලබාදුන් අතර ඉදිරි කටයුතු සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දෙන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br>දිස්ත්‍රික් ඉංජිනේරු, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |
| 10. | සාකච්ඡාකරන ලද වෙනත් කරුණු | | | |
| 10.1 | මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය පිහිටි ටවර්හිල් ප්‍රදේශය සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීමට යෝජනා කිරීම | නාගරික සංවර්ධන අධිකාරිය මගින් මේ සඳහා සැලසුමක් සකස් කර ඇති බවත් එකී සැලැස්ම සමග නව අදහස් හා මේ වන විට නව සුදුසු ස්ථානයන් හඳුනාගනිමින් මෙම ප්‍රදේශයේ පවතින සියළු සම්පත් භාවිතයට ගනිමින් සංචාරක කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතු බවත් දීර්ඝලෙස සාකච්ඡා විය. | අදාල සියලු අංශ කැඳවා සාකච්ඡා කර මීලඟ කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම්, හම්බන්තොට<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය<br>සහකාර අධ්‍යක්ෂ, ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය<br>කෞතුකාගාර අධිකාරී, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව |

විමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 10.2 | වනඅලි ගම්වැදීමේ ගැටලුව | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක වනඅලින් ගම්වැදීම හේතුවෙන් සාමාන්‍ය ජනජීවිතයට ගැටලුකාරී තත්ත්වයක් ඇතිවී තිබෙන බව හා වනඅලින් පලවා හැරීමේදී සාමාන්‍ය ජනතාවගේ හැසිරීම බාධාවක්ව පවතින බවත් මේ සඳහා සාධනීය විසඳුමකට ලගා විය යුතු බවත් සාකච්ඡා වූ අතර සූරියවැව සිට කොහොලංකල දක්වා 10km අලිවැට සංවර්ධන කටයුතු සමහ ඇති වූ තත්ත්වයක් වියහැකි බවට ද වැඩිදුරටත් කරුණු ඉදිරිපත් විය.<br><br>තවද, මෙම ප්‍රදේශයට ඇතුල්වී සිටින වන අලින් සම්බන්ධව නිරන්තරව නිරීක්ෂණය කරමින් ඔවුන් පලවා හැරීමේ කටයුතු සිදු කෙරෙන බවත් දන්වන ලදි. එමෙන්ම, ප්‍රදේශවාසීන්ගේ සහයෝගය ලබා ගැනීම සඳහා වන අලින් ගම්වැදෙන අවස්ථාවල ඔවුන් පලවා හැරීම සඳහා මහජන සහාය ලබා ගැනීමට ග්‍රාමීය කමිටු සාමාජිකයින් දෙදෙනෙක් හෝ කිහිප දෙනෙක් පුහුණු කලයුතු බවටද යෝජනා විය.<br><br>එසේම, පවතින විදුලිවැටවල්වල තිබෙන දුර්වලතා හේතුවෙන් වනඅලි ගම්වැදීම් සිදුවන බවත් නිවැරදිව හා හොඳින් නඩත්තුව සිදුකරනවානම් වඩා ඵලදායී එල්ලෙන විදුලි වැට බවත් ඒ සඳහා විදුලි වැට ඉදිකිරීමේදී අඩි 18 කින් උස ලයිට් කණු ඉදිකිරීම සුදුසු බව යෝජනා කරන ලද අතර එල්ලෙන විදුලි වැට ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් නොගැනීමට හේතුව කුමක්ද යන්න පිළිබඳව හා විදුලි වැට ආරක්ෂාවට යොදවන ලද සිවිල් ආරක්ෂක නිලධාරීන් වෙනත් රාජකාරී සඳහා යෙදවීම ගැටලුවක් බවත් වැඩිදුරටත් සාකච්ඡා විය. | මහජනතාවගේ ජීවිත හා දේපල ආරක්ෂා වන පරිදි වන අලින් වනය තුළට පලවා හැරීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි.<br><br>මෙම යෝජනාවේ වඩාත් සුදුසුබව සහ ඵලදායී බව පැහැදිලි කරමින් අමාත්‍යාංශය දැනුවත් කරන ලෙස හා ඉදිකර ඇති විදුලි වැටවල් සියළු අංශ සහ සියළු පාර්ශව එක්වී සාකච්ඡා කර අවශ්‍ය පරිදි ක්‍රියාමාර්ග ගෙන ආරක්ෂා කලයුතු බවට උපදෙස් දෙන ලදි. | අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්,<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල<br><br>සහකාර අධ්‍යක්ෂ (වනජීවී)<br><br>දිසාවන නිලධාරී, හම්බන්තොට |
| 11. | පසුව ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කර ගනුලැබූ තීරණ. | | | |
| 11.1 | සැප්තැම්බර් මාසයට යෙදී ඇති සාහිත්‍ය මාසය | සාහිත්‍ය මාසය වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12 සඳහා වැඩසටහන් 2 බැගින් සිදුකරන බවත් සියළු අංශ එකතුවී ඒකාබද්ධ වැඩසටහනක් සිදුකිරීමට හා දකුණු පළාත් සාහිත්‍ය මහෝත්සවයක් සැලසුම්කර ඇති බවත් පැහැදිලි කරන ලදි. | කලාවේ සහ සාහිත්‍යයේ ප්‍රබෝධයක් ඇතිකිරීමට ගන්නා මෙම උත්සාහය සඳහා සියළුදෙනාගේ මැදිහත්වීම සහ කැපවීම ලබා දෙන ලෙස පවසන ලදි. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,<br><br>දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරී |

නිමල් ඉන්ද්‍රසිරි ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 11.2 | ප.ව. 4.15 න් පසු පරිපාලන සංකීර්ණය ඉදිරිපසින් මගී ප්‍රවාහන බස්රථ ගමන් නොකිරීම. | රාජකාරී නිමවීමෙන් පසු තිස්සමහරාම සහ කතරගම ප්‍රදේශකරා ගමන්කිරීමට පරිපාලන සංකීර්ණය ඉදිරිපසින් මගී ප්‍රවාහන බස්රථ නොමැති වීම දිගුකාලයක් තිස්සේ පවතින ගැටලුවක් බව සාකච්ඡා විය. | පරිපාලන සංකීර්ණය ඉදිරිපසින් ගමන් නොකරන ලද මගී ප්‍රවාහන බස්රථ සම්බන්ධව දැනුවත් කරන ලෙසත් ඒ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉතා ඉක්මනින් අදාල ආයතන එක්ව ක්‍රමවත් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | සභාපති,<br>දකුණු පළාත් මාර්ගස්ථ හා මගී ප්‍රවාහන අධිකාරිය.<br><br>ඩිපෝ කළමනාකරුවන්,<br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය |

යෝජිත මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා අදාල මසියළු නිලධාරීන්ගේ පැමිණීම අනිවාර්ය බවත් අද දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තුතිය පල කිරීමෙන් අනතුරුව පස්වරු 2.15 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

2025 සැප්තැම්බර් මස 03
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.

ඇමුණුම 01

**හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනෙකුත් ආයතනවල සංවර්ධන ව්‍යාපෘතිවල 2025.08.20 දිනට ප්‍රගතිය**

| අ.අ | ආයතනය | ව්‍යාපෘති සංඛ්‍යාව | 2025 වර්ෂයට වෙන්කළ මුදල (රු.මි.) | වැඩ ආරම්භ කර ඇති ව්‍යාපෘති ගණන | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු. මි. |
|---|---|---|---|---|---|---|
| 1 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 4 | 1205.37 | 3 | 1 | 172.6 |
| 2 | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 1 | 12.87 | 1 | - | 5.5 |
| 3 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 37 | 98.26 | 36 | 1 | 0.3 |
| 4 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 103 | 276.78 | 94 | 9 | 13.99 |
| 5 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 8 | 39.76 | 8 | - | 0.98 |
| 6 | ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා) | 6 | 3.8 | 5 | 1 | 2.88 |
| 7 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 1 | 1.9 | 1 | - | 1.07 |
| 8 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය(නා.ස.අ) | 1 | 35 | 1 | - | - |
| 9 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය(නි.ස.අ) | 3 | 142.9 | 3 | - | 62.41 |
| | **එකතුව** | **164** | **1816.64** | **152** | **12** | **259.73** |